දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
இசுருபாய, ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } ඊඩී/01/10/01/01/16

දිනය / திகதி / Date } 2006.03.10

චක්‍රලේඛ අංකය :- 2006/13

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
....................................
....................................

**රජයේ අනුමත පෞද්ගලික පාසල් වල විදුහල්පති , නියෝජ්‍ය විදුහල්පති , සහකාර විදුහල්පති තනතුරු.**

රජය අනුමත පෞද්ගලික පාසල් වල පරිපාලන කටයුතු වල නිරත වන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති , සහකාර විදුහල්පති සහ අංශ ප්‍රධාන යන තනතුරු දරණ ගුරු භවතුන්ට විශේෂ ශ්‍රේණි ප්‍රදානය කිරීම සිදු කෙරේ.

02. රජය අනුමත පෞද්ගලික පාසල්හි විශේෂ ශ්‍රේණිධාරින් දැනට රජයේ පාසල්වල විදුහල්පති ශ්‍රේණි තනතුරුධාරින් ඉටු කරනු ලබන රාජකාරි වලට සමාන රාජකාරි ඉටු කරනු ලබන නිසාත් ඒ හා සමාන වැටුප් ලබන නිසාත් , මෙම විශේෂ ශ්‍රේණිධාරී තනතුරු නාමයන් 2006.01.01 දින සිට පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

| පැරණි තනතුරු නාමය | | සංශෝධිත තනතුරු නාමය |
|---|---|---|
| විශේෂ තනතුර | I ශ්‍රේණිය | - පෞද්ගලික පාසල් විදුහල්පති I ශ්‍රේණිය |
| විශේෂ තනතුර | II ශ්‍රේණිය | - පෞද්ගලික පාසල් විදුහල්පති 2 - I ශ්‍රේණිය |
| විශේෂ තනතුර | III ශ්‍රේණිය | - පෞද්ගලික පාසල් විදුහල්පති 2 - II ශ්‍රේණිය |

තනතුරු නාම වෙනස් වුවත් අධ්‍යාපන ලේකම්ගේ අංක 95/23 හා 2005/12 චක්‍රලේඛයන්හි දක්වා ඇති තනතුරු සංඛ්‍යාව හා බඳවා ගැනීමේ සුදුසුකම් තවදුරටත් ඒ ආකාරයටම ක්‍රියාත්මක වේ.

03. පෞද්ගලික පාසලක විදුහල්පති ශ්‍රේණිධාරීන් කිහිප දෙනෙකු සිටින විට උසස්ම ශ්‍රේණිය දරණ ගුරු භවතා එම පාසලේ විදුහල්පති ලෙස කළමනාකරු විසින් පත්කළ යුතු අතර සෙසු ශ්‍රේණිධාරීන් ශ්‍රේණි අනු පිළිවෙලට නියෝජ්‍ය විදුහල්පති , සහකාර විදුහල්පති යන තනතුරු වලට පත් කිරීම කළ යුතුය. එහෙත් කිසියම් සාධාරණ හේතුවක් යටතේ පාසලේ අභිවෘද්ධිය සඳහා මෙම පත්කිරීමට පටහැනිව පත්වීමක් කළ යුතු නම් ඒ පිළිබඳ කරුණු දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල්, අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතුය.

04. සමාන ශ්‍රේණිධාරීන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු සිටින විට වඩාත් සුදුසු තැනැත්තා විදුහල්පති ධුරයට තෝරා පත් කිරීමේ බලය කළමනාකරු සතු වේ.

05. මෙම විශේෂ ශ්‍රේණිධාරී තනතුරු පාසලක් වෙනුවෙන් අනුමත කරන තනතුරක් විනා පුද්ගලයකු වෙනුවෙන් අනුමත කරන තනතුරක් නොවන බැවින් , විශේෂ ශ්‍රේණිධාරියා ඊට ඉහළ තනතුරකට උසස් කිරීමක් සිදු නොවේ. තනතුරු ධාරියා වෙනත් පාසලකට පත්වීමක් ලබා යන විට ඔහු / ඇය පත්වීම් ලබා ගත් පාසලේ විශේෂ ශ්‍රේණි පුරප්පාඩුවක් පවතී නම් හා මෙම තනතුරුධාරියා එයට සුදුසුකම් ලබා ඇති නම් පමණක් එම පුරප්පාඩුව සඳහා ඔහු හෝ ඇය යෝජනා කර එවීමට පාසල් කළමනාකරුට පුලුවන. එසේ නොමැති විට ඔහුගේ / ඇයගේ ශ්‍රේණිධාරී තනතුර පෙර කී පාසලින් ඉවත්වී යන විට අහෝසි වේ. මෙවන් අවස්ථාවක නව පාසලේ තමන්ට හිමි වන තනතුර අනුව වැටුප් ක්‍රමයද තීරණය වන අතර , නව පාසලේ විදුහල්පති ශ්‍රේණිධාරී තනතුරක් නොලැබේ නම්, ගුරු සේවයේ තම සුදුසුකම් වලට අදාළ ශ්‍රේණියට නියමිත වැටුප ලබා ගැනීමට සිදුවනු ඇත. මේ නිසා මෙබඳු තනතුරුධාරීන් ස්ථාන මාරු ලබා ගැනීමේදී , මෙම තත්වය පිළිබඳව මෙම තනතුරුධාරීන් දැනුවත් කොට ඒ සඳහා ඔහුගේ / ඇයගේ කැමැත්ත ලිඛිතව ලබා ගත යුතු අතර ලොග් පොතෙහි ඒ බැව් සටහන් කළ යුතුය.

06. මෙවන් අවස්ථාවකදී විශේෂ ශ්‍රේණිධාරියකු / විදුහල්පති ශ්‍රේණිධාරියෙකු ලෙස සේවය කළ සීමාව එකී තනතුර ලැබෙන අවස්ථාවේ පෞද්ගලික පාසල් ගුරු සේවයේ හිමිව තිබූ ශ්‍රේණියේ / පන්තියේ , සේවා කාලයක් ලෙස සලකා කටයුතු කළ යුතුය. මෙම ගුරු භවතා එම සේවා කාලය සහ අනෙකුත් සුදුසුකම් ද පදනම් කොට ගෙන ඊට ඉහළ ශ්‍රේණියට උසස් වීම් සඳහා සුදුසුකම් ලබන්නේ නම් , හා තව දුරටත් විශේෂ ශ්‍රේණිධාරී හෝ විදුහල්පති වශයෙන්

ගතකල සේවා කාලය ශේෂ වන්නේ නම් , එකී සේවා කාලය , උසස්වීම් ලැබූ ශ්‍රේණියේ ගතකල සේවා කාලයක් සේ සලකා කටයුතු කළ යුතුය.

07. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ 2000.08.01 දිනැති 2/මුපා/පෞපා/විවිධ අංකිත උපදෙස් ලිපියෙන් සියලුම කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන් වෙත දන්වා යවා ඇති විශේෂ ශ්‍රේණි ධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප්. මෙම නව ශ්‍රේණිධාරීන්ට ද එලෙසම අදාළ වේ.

ආරියරත්න හේවගේ
ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. විගණකාධිපති
02. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ.
03. ප්‍රධාන ගණකාධිකාරී , අධ්‍යාපන අමාත්‍යාංශය
04. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ. ........................................................
05. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ. ................................................
06. කළමනාකරු / විදුහල්පති ........................................................